# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දේශීය ආදායම් (සංශෝධන)

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2014 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2014 මාර්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[293 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 26.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 008091—525 (2014/03)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට ආනුෂංගිකව ප්‍රධාන ප්‍රඥප්තියේ සඳහන් ඇතැම් නිලධරයන්ගේ තනතුරු නාම වෙනස් කිරීම වේ.

***3 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ආදායම් බදු ගෙවීමෙන් ඇතැම් ව්‍යවස්ථාපිත ආයතන නිදහස් කිරීම වේ.

***4 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ යම් තක්සේරු වර්ෂයක් සඳහා රු. 48,000/- ක් නොඉක්මවන වෙනත් ආදායම් ඇති සේවා නියුක්තයන් සඳහා ආන්තික බදු සහනයක් ප්‍රදානය කිරීම වේ.

***5 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු නිදහස් කිරීම අදාළ වීම පුළුල් කිරීම වේ.

***6 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ 13 (ඒ) වගන්තිය යටතේ නිදහස් කරන ලද ලාභාංශවලින් ගෙවනු ලබන ලාභාංශවල බදු නිදහස් කිරීම පුළුල් කිරීම වේ.

***7 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ:-

(අ) ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන බුද්ධිමය දේපළ අත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා බදු නිදහසක් ලබාදීම; සහ

(ආ සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සහ සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමට සපයනු ලබන පරිගණක මෘදුකාංගවලින් උපයනු ලබන ලාභ සහ ආදායම බද්දෙන් නිදහස් කිරීම වේ.

***8 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු විරාම අදාළ වීම සීමා කිරීම වේ.

***9 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඉ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු නිදහස, ජීව විද්‍යාත්මක පොහොර සඳහා ද ලබාදීම වේ.

***10 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු විරාම අදාළ වීම සීමා කිරීම වේ.

***11 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු විරාම අදාළ වීම සීමා කිරීම වේ.

***12 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන බුද්ධිමය දේපළ අත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා සහන ලබා දීම වේ.

***13 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ලාභ සහ ආදායම ගණනය කිරීමේ දී බෝග රක්ෂණ බදු අඩු කිරීම සඳහා ඉඩ නොදීම වේ.

***14 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තියට ආනුෂංගික වේ.

***15 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ වරදක් නිවැරදි කිරීම ය.

***16 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ:-

(අ) ව්‍යාපාර ව්‍යවසායක් පුළුල් කිරීමේ දී, අඩු කිරීම සඳහා සුදුසුකම් ලබන ගෙවීම් අදාළ වීම සීමා කිරීම;

(ආ) නිවසක් ඉදිකිරීම හෝ නිවසක් මිලදී ගැනීම හෝ පදිංචිය පිණිස වන මහල් නිවාස සංකීර්ණයක නිවාස ඒකකයක් මිලදී ගැනීම සඳහා වෘත්තිකයන් වන සේවා නියුක්තයන් වෙනුවෙන් සහන ලබාදීම; සහ

(ඇ) බැංකු හා මූල්‍ය සමාගම් ඒකාබද්ධ කිරීම උනන්දු කරවීම සඳහා සහන සැපයීම වේ.

***17 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තිය අදාළ වීම අවසන් කිරීම සහ 18 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධනයක් සිදු කිරීම වේ.

***18 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 40ඇ වගන්තිය අලුතෙන් ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වෘත්තිකයන්ගේ සේවානියුක්ත ආදායම මත සහනදායී බදු අනුප්‍රමාණයක් ලබාදීම වේ.

***19 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු සහනය අදාළ වන කාලසීමාව පුළුල් කිරීම වේ.

***20 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු සහනය අදාළ වන කාලසීමාව පුළුල් කිරීම වේ.

***21 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු සහනය අදාළ වන කාලසීමාව පුළුල් කිරීම වේ.

***22 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 56ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ ඇති වරදක් නිවැරදි කිරීම වේ.

***23 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු සහන අදාළ වීම පුළුල් කිරීම වේ.

***24 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 26 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***25 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ 20% කට නොඅඩු කොටස් ප්‍රමාණයක් මහජනතාව විසින් දරන, ලැයිස්තුගත සමාගම් සඳහා බදු සහන කාලසීමාව දීර්ඝ කිරීම වේ.

***26 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 59ඊ, 59උ සහ 59ඌ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිවල නීතියේ බලපෑම වනුයේ:-

(අ) 59ඊ වගන්තිය මගින්, වෘත්තිකයන් සඳහා සහනදායී ආදායම් බදු අනුප්‍රමාණ හඳුන්වාදීම;

(ආ) 59උ වගන්තිය මගින්, ඉදිකිරීම් කාර්ය සඳහා වෘත්තිකයන්ට ප්‍රදානය කරනු ලබන ණය මුදල් මත බැංකු උපයන ආදායම සඳහා බදු සහන ලබාදීම; සහ

(ඇ) 59ඌ වගන්තිය මගින්, නාවික කර්මාන්තයේ නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා බදු සහන ලබාදීම වේ.

***27 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තියේ විධිවිධාන සඳහා පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම ය.

***28 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම, 13 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***29 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ සඳහන් වරදක් නිවැරදි කරනු ලැබේ.

***30 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියේ සඳහන් වරදක් නිවැරදි කරනු ලැබේ.

***31 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ තොරතුරු ඉල්ලා සිටීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත බලය ලබාදීම වේ.

***32 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ විගණන වාර්තා සකස් කිරීමේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පිළිගනු ලැබීම වේ.

***33 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියට පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම ය.

***34 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 117අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එක් සේවා යෝජකයකුට වැඩි සේවායෝජකයන් ගණනක් යටතේ සේවයෙහි නියුක්තව සිටින රාජ්‍ය අංශයේ සේවා නියුක්තයකුගේ 10% අනුප්‍රමාණය යටතේ බදු ගෙවීමට යටත් වන මාසික ලැබීම් සීමා කිරීම වේ.

***35 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තියේ සඳහන් වරදක් නිවැරදි කිරීම ය.

***36 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තියේ සඳහන් වරදක් නිවැරදි කිරීම ය.

***37 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඒ වගන්තියේ විධිවිධාන සඳහා වැඩි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම ය.

***38 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අදාළ කර ගැනීමේ දී කරනු ලබන ගැළපීම් සම්බන්ධයෙන් වන කාල කඩඉම ලිහිල් කිරීම ය.

***39 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය සමාගම් පනතේ විධිවිධානවලට ආනුෂංගික වන සංශෝධනයකි.

***40 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***41 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඇතැම් රාජ්‍ය ආයතන විසින් ඉල්ලීම් කරනු ලැබීමේ දී, තොරතුරු ලබාදීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට හැකියාව ලබාදීම වේ.

***42 වන වගන්තිය***:- මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් වෙනස් කරනු ලබන යම් අවස්ථාවක ලාභ සහ ආදායම ගණනය කරනු ලැබිය යුතු ආකාරය නියම කරමින් නියෝග සෑදීමට හැකියාව ලබාදීම ය.

***43 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "බලයලත් නියෝජිතයා" සහ "විධායක නිලධරයා" යන යෙදුම්වල නිර්වචන සංශෝධනය කිරීම ය.

***44 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එය 25 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***45 වන වගන්තිය***:- මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එය 26 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**එල්.ඩී.—ඕ. 5/2014**

## 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2014 අංක    දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2014 අප්‍රේල් මස 1 වන දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

2006 අංක 10 දරන පනත සංශෝධනය කිරීම.

**2.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්" යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට "අතිරේක කොමසාරිස් ජනරාල්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ "කොමසාරිස්" යන වචනය යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට "ජ්‍යෙෂ්ඨ කොමසාරිස්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ "නියෝජ්‍ය කොමසාරිස්" යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට "කොමසාරිස්" යන වචනය ආදේශ කිරීමෙන්;

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ "ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු" යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට "නියෝජ්‍ය කොමසාරිස් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) ප්‍රධාන ප්‍රඥප්තියේ "තක්සේරුකරු" යන වචනය යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට "සහකාර කොමසාරිස්" යන වචන ආදේශ කිරීමෙන්.

2—PL 008032—475 (2014/03)

**3.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ,

(අ) (lxviii) වන අනුඡේදයේ "සංවර්ධන බැංකුවේ; සහ" යන වචන වෙනුවට "සංවර්ධන බැංකුවේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (lxix) වන අනුඡේදයේ "රජයේ ආධාර ලබන පෞද්ගලික පාසලක," යන වචන වෙනුවට "රජයේ ආධාර ලබන පෞද්ගලික පාසලක;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (lxix) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන්:-

"(lxx) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ;

(lxxi) 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ;

(lxxii) 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයේ; සහ

(lxxiii) (87 වන අධිකාරය වූ) භාර ආඥා පනතේ 114 වන වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද ලයනල් වෙන්ඩ්ට් අනුස්මරණ අරමුදලේ,";

(2) ඒ වගන්තියේ (ඕ) ඡේදයේ "රක්ෂණ යෝජනා ක්‍රමයේ ලාභ සහ ආදායම," යන වචන වෙනුවට "රක්ෂණ යෝජනා ක්‍රමයේ ලාභ සහ ආදායම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඕ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ක) කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන, අන්තර්ජාතික ජාලයේ ආයතනවල මූලස්ථාන හෝ කලාපීය ප්‍රධාන කාර්යාල ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමෙන් 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පිහිටුවන ලද යම් ආයතනයක ලාභ සහ ආදායම,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ 1 වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ණ) ඡේදයේ "ඒ වෙනුවට ලිත් මාසයක කාලයක් සඳහා ගෙවනු ලබන යම් දීමනාවක්" යන වචන වෙනුවට "ඒ වෙනුවට ලිත් මාසයක කාලයක් සඳහා ගෙවනු ලබන යම් දීමනාවක් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රවාහන පහසුකමක වටිනාකම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ප) ඡේදයේ "රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන යම් කොටසක්." යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන යම් කොටසක්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ උපවගන්තියේ (ප) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(බ) සේවා නියුක්තයකු වන්නා වූ ද, යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක නිරත නොවන්නා වූ ද යම් පුද්ගලයකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වන සේවා නියුක්ති ආදායම හෝ ප්‍රභවයේ දී අවසාන බද්දක් ලෙස බදු අයකරනු ලබන ලාභ සහ ආදායම හෝ නොවන, ලාභයෙහි සහ ආදායමෙහි එකතුව රුපියල් හතළිස් අට දහසකට වැඩි නොවන්නේ නම් හා ඒ තක්සේරු

වර්ෂය සඳහා ඔහුගේ සේවා නියුක්ති ආදායමෙන් බදු අඩු කරනු ලබන්නේ නම්, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පුද්ගලයාගේ රුපියල් හතළිස් අටදහසක් නොඉක්මවන ලාභ සහ ආදායම.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "ශ්‍රී ලංකාවෙන් පිටත" යන වචනවල සිට "වෙනත් යම් ව්‍යවසායකට" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හෝ යම් ව්‍යාපාරික සම්බන්ධතාවයක් තිබීම යන්න නොතකා, ඒ සමාගම, හවුල් ව්‍යාපාරය හෝ පුද්ගල මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (ඔ) ඡේදයේ "භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමක" යන වචන වෙනුවට "සුරැකුම්පත් ආයෝජන ගිණුමක" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ අතුරු විධානයේ "යම් ලාභාංශයක් සඳහා අදාළ විය යුතු ය." යන වචන වෙනුවට "යම් ලාභාංශයක් සඳහා අදාළ විය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඕ) යම් සමාගමක් විසින් ලද (ඒ) ඡේදයේ සඳහන් ආදායම් බද්දෙන් නිදහස් කර ඇති ලාභාංශයකින්, ඒ සමාගම විසින් තම කොටස් හිමියකුට ගෙවන

ලද යම් ලාභාංශයක්, ඒ දෙවනුව සඳහන් කළ ලාභාංශය ගෙවනු ලැබුවේ පළමුව සඳහන් කළ ලාභාංශය ලැබුණු දින සිට මාස තුනක් ඇතුළත නම්,".

**7.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (මමමමමමම) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(මමමමමමමම) ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන යම් බුද්ධිමය දේපළක් 2014 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව අත්කර ගන්නා වූ ද, ඒ බුද්ධිමය දේපළෙන් රාජ්‍ය භාගයක් වශයෙන් ලාභ සහ ආදායම් උපයන්නා වූ ද, ශ්‍රී ලංකාවේ වාසික යම් තැනැත්තකුට ඒ රාජ්‍ය භාගය විදේශීය ව්‍යවහාර මුදලින් ලැබිණි නම් හා එය බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබිණි නම්, ඒ ලාභ සහ ආදායම;"; සහ

(2) ඒ වගන්තියේ (යයයයයයය) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(යයයයයයයය) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ හෝ සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ යම් විශේෂිත අවශ්‍යතාවයක් අනුව, ඒ ගුවන් සමාගම්වල භාවිතය සඳහා යම් පරිගණක මෘදුකාංග ලබාදීම වෙනුවෙන් කරනු ලබන ගෙවීමකින්, ශ්‍රී ලංකාවෙන් පිටත රටක යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ඇති වන හෝ උපචිත වන ලාභ සහ ආදායම මත

ද්විත්ව බදු ගෙවීම් සම්බන්ධයෙන් සහනය සලසන ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා වන ගිවිසුමක් ශ්‍රී ලංකාව හා එම රට අතර බලාත්මකව නොපවතී නම් හෝ ඒ ලාභ සහ ආදායම මත එම රටේ දී බදු ගෙවිය යුතු නොවන්නේ නම්, ඒ ලාභ සහ ආදායම."

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තිය සංශෝධනය කිරීම.

**8.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඈ වගන්තියේ "2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පිහිටුවනු ලැබුවා වූ ද," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව පිහිටුවනු ලැබුවා වූ ද," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඉ වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඉ වගන්තියේ "කාබනික පොහොර" යන වචන වෙනුවට "කාබනික පොහොර හෝ ජීව විද්‍යාත්මක පොහොර" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය සංශෝධනය කිරීම.

**10.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියේ (2) වන උපවගන්තියේ" ක්‍රියාකාරකමක නිරතව සිටින;" යන වචනවල සිට ඒ වගන්තිය අවසානය දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"ක්‍රියාකාරකමක නිරතව සිටින;

(ආ) 2011 මාර්තු මස 31 වන දිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමෙහි ලා ආයෝජනය කරන ලද මුදල (1) වන උපවගන්තියේ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන අනුරූප මුදලට අඩු නොවන;

(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වාණිජ කටයුතු ආරම්භ කරන; සහ

(ඈ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කැඩීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ අත්කර ගැනීම මගින් පිහිටුවනු නොලැබුවා වූ,

යම් ව්‍යවසායක් අදහස් වේ.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආයෝජනය" යන්නෙන් යම් ඉඩමක, පිරියතවල, යන්ත්‍රෝපකරණවල, උපකරණවල සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.".

**11.** 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ ව්‍යවසාය ආරම්භ කර එක් වර්ෂයක් ඇතුළත රුපියල් මිලියන දෙකකට නොඅඩු මුදලක් එහි ආයෝජනය කරන්නා වූ" යන වචන වෙනුවට "ඒ ව්‍යවසාය ආරම්භ කර එක් වර්ෂයක් ඇතුළත, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව රුපියල් මිලියන දෙකකට නොඅඩු මුදලක් එහි ආයෝජනය කරන්නා වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ද) ඡේදයේ "ආණ්ඩුවට ගෙවනු ලබන යම් මුදලක්." යන වචන වෙනුවට "ආණ්ඩුවට ගෙවනු ලබන යම් මුදලක්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ද) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(න) ඒ ලාභ සහ ආදායම ඉපයීම සඳහා පාවිච්චි කරනු ලබන යම් ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන බුද්ධිමය දේපළක් අත්කර ගැනීමේ පිරිවැය;

(ප) ඒ තැනැත්තා විසින් ගෙවන ලද යම් රාජ්‍ය භාගයක් හෝ යම් බිම් කුලියක්.".

**13.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ (vi) වන අනුඡේදයේ "යම් සමාජ වගකීමේ බද්දක්," යන වචන වෙනුවට "යම් සමාජ වගකීමේ බද්දක්; හෝ"; යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(vii) 2013 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ 14 වන වගන්තිය යටතේ අයකරනු ලබන යම් බෝග රක්ෂණ බද්දක්,"

(ඇ) ඒ උපවගන්තියේ (ක) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ක) ඒ තැනැත්තා විසින් ගෙවන ලද යම් වාර්ෂිකයක්;";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "27 වන වගන්තිය යටතේ අඩු කිරීමක්, කරනු නොලැබිය යුතු යː" යන වචන වෙනුවට "27 වන වගන්තිය යටතේ අඩු කිරීමක්, කරනු නොලැබිය යුතු අතර, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ වියදමේ සමස්තය හෝ ඒ වියදමේ යම් කොටසක් සඳහා ඉඩ නොදෙමින් තක්සේරුවක් කරනු ලැබිය යුතු යː" යන වචන ආදේශ කිරීමෙන්.

**14.** 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "25 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි වූ පොළියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක් වශයෙන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "25 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි වූ වාර්ෂිකයක් හෝ පොළියක් වශයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඇ) ජීවිත රක්ෂණ ව්‍යාපාරයක් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තකු විසින්, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි ඒ ජීවිත රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් වෙන් සමාගම් දෙකක් වශයෙන් වෙන් කරනු ලබන අවස්ථාවක දී, ඒ වෙන් කිරීමට පෙරාතුව දරන ලද යම් අලාභයක සමස්තය හෝ ඒ අලාභයෙන් යම් කොටසක් ඒ වෙන් කිරීමට කලින් අඩු කරනු නොලැබී නම්, ඒ වෙන් කිරීමේ දිනට පවතින ඒ අලාභය හෝ ඒ අලාභයේ කොටස මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, අදාළ සමාගම්වල මුලු ව්‍යවස්ථාපිත ආදායමෙන් පහත සඳහන් පරිදි අඩු කරනු ලැබිය යුතු යː-

(i) ජීවිත රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කළ හැකි අලාභ කොටස, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යනු ලබන සමාගමේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්;

(ii) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කළ හැකි අලාභ කොටස, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යනු ලබන සමාගමේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්;"; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ "මේ පනතේ 16 වන වගන්තිය හෝ 17 වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ පනතේ 16 වන වගන්තිය හෝ 16අ වගන්තිය හෝ 16ආ වගන්තිය හෝ 16ඇ වගන්තිය හෝ 16ඈ වගන්තිය හෝ 17 වන වගන්තිය හෝ 17අ වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**15.** 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ තවදුරටත් අතුරු විධානයේ (ii) වන අයිතමයේ "යම් සේවා නියුක්ත ආදායමකින්, 34 වන වගන්තිය යටතේ යම් දීමනාවක කොටසක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "යම් සේවා නියුක්ත ආදායමකින්, 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ද) සහ (න) යන ඡේදවල සඳහන් දීමනාව හැර, 34 වන වගන්තිය යටතේ වන යම් දීමනාවක කොටසක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**16.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ඝ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඝ) 16ඇ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ බද්දෙන් නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබන්නා වූ ද, 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ව්‍යාපාරික කටයුතු ආරම්භ කර ඇත්තා වූ ද, යම් ව්‍යවසායක, යම් තැනැත්තකු විසින් ඒ ව්‍යවසාය පුළුල් කිරීමේ දී ස්ථාවර වත්කම් අත් කර ගැනීමෙහිලා 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව කරන ලද රුපියල් මිලියන පනහකට අඩු නොවන ආයෝජනයක්:

එසේ වුව ද, ඒ ආයෝජනය, ඒ ව්‍යවසාය පුළුල් කිරීමේ දී බලශක්ති කාර්යක්ෂමතා කාර්ය සඳහා හෝ තාක්ෂණය ඉහළ නැංවීමේ කාර්ය සඳහා

හෝ නව තාක්ෂණය හඳුන්වාදීමේ කාර්ය සඳහා හෝ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර භාවිතයෙන් බලශක්ති උත්පාදනය සඳහා හෝ අධි තාක්ෂණික පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගැනීම පිණිස කරන ලද්දේ නම් හා 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව කරන ලද්දේ නම් ඒ ආයෝජනය සුදුසුකම් ලබන ගෙවීමක් විය යුතු ය;";

(ආ) ඒ උපවගන්තියේ (ද) ඡේදයේ "මුදල් ප්‍රමාණය; සහ" යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (න) ඡේදයේ "නොඉක්මවන කොටස." යන වචන වෙනුවට "නොඉක්මවන කොටස;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) ඒ උපවගන්තියේ (න) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ප) යම් වෘත්තිකයකු වන්නා වූ ද, 106 වන වගන්තිය යටතේ වාර්තාවක් සපයන්නා වූ ද යම් පුද්ගලයකු විසින්, ඒ පුද්ගලයා විසින් තනිවම හෝ වෙනත් යම් පුද්ගලයකු සමග එක්ව, නිවසක් ඉදිකිරීම සඳහා හෝ නිවසක් මිලදී ගැනීම සඳහා හෝ පදිංචිය පිණිස වන මහල් නිවාස සංකීර්ණයක නිවාස ඒකකයක් මිලදී ගැනීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී යම් බැංකුවකින් හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී යම් මූල්‍ය සමාගමකින් ලබාගත් යම් ණය මුදලක මුල් මුදල ආපසු ගෙවීමේ දී 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා දරන ලද රුපියල් ලක්ෂ හයක් නොඉක්මවන යම් වියදමක්:

එසේ වුව ද, ඒ ණය මුදල වෙනත් යම් පුද්ගලයකු සමග එක්ව ගනු ලබන්නේ නම් හෝ සම අයිතිය දරන දේපළක් වෙනුවෙන් ගනු ලබන්නේ නම්, ඒ අඩු කිරීම ඒ ණය මුදල ගනු ලැබූ පුද්ගලයාට ආරෝපණය කළ හැකි වියදමේ ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා "වෘත්තිකයකු" යන්නට 40ඇ වගන්තියේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුත්තේ ය;

(බ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී යම් බැංකුවක් හෝ යම් මූල්‍ය සමාගමක් විසින්, වෙනත් යම් බැංකුවක් හෝ වෙනත් යම් මූල්‍ය සමාගමක් අත්කර ගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය වශයෙන් දරන ලද යම් වියදමක්, එකී පිරිවැය එක් එක් අවස්ථාව මත පදනම්ව, තත්කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව නිශ්චය කරනු ලබන අවස්ථාවක හා ඒ වියදම 25 වන වගන්තිය යටතේ අඩු කරගත නොහැකි වියදමක් වන විට, ඒ බැංකුව හෝ මූල්‍ය සමාගම විසින් දරන ලද ඒ වියදම.";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ "(ත), (ද) සහ (න) යන ඡේදවල සඳහන්" යන වචන වෙනුවට "(ත), (ද), (න) සහ (ප) යන ඡේදවල සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "(ඪ), (ණ) සහ (ත) යන ඡේදවල" යන වචන වෙනුවට "(ඪ), (ණ), (ත) සහ (බ) යන ඡේදවල" යන වචන ආදේශ කිරීමෙන්.

**17.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තියේ "2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 40ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යඃ- ප්‍රධාන ප්‍රඥප්තියට 40ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"වෘත්තිකයන්ගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණ.

40ඇ. (1) 2014 අප්‍රේල් මස 1 වන දින හෝ ඊදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන පුද්ගලයකුගේ බදු අයකළ හැකි ආදායමට, ඒ පුද්ගලයා යම් වෘත්තිකයකු වශයෙන් සේවය කිරීමෙන් ලබන (මෙහි මින්මතු මේ වගන්තියේ "අදාළ ලාභය" වශයෙන් සඳහන් කරනු ලබන) ලාභය ඇතුළත් වන අවස්ථාවක දී සහ (මෙහි මින්මතු මේ වගන්තියේ "බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) එම බදු අයකළ හැකි ආදායමේ කොටසක් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය සියයට දහසයක් ඉක්මවන අවස්ථාවක දී, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන ආකාරයට ගණනය කළ යුතු යඃ-

(අ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස, අදාළ ලාභයට වඩා වැඩි වන අවස්ථාවක -

(i) අදාළ ලාභ මුදල හා සමාන බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද, සියයට දහසයක අනුප්‍රමාණයකට ගණනය කරනු ලැබිය යුතු ය; සහ

(ii) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ඉතිරි කොටස මත ගෙවිය යුතු බද්ද, මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ ඊට අදාළ වන්නා වූ, සියයට දහසයකට වඩා වැඩි අනුප්‍රමාණයකට අනුව ගණනය කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස අදාළ ලාභයට වඩා වැඩි නොවන අවස්ථාවක, බදු අය කළ හැකි ආදායමේ අදාළ සම්පූර්ණ කොටස මත ගෙවිය යුතු බද්ද, සියයට දහසයක අනුප්‍රමාණයට ගණනය කරනු ලැබිය යුතු ය.".

(2) මේ වගන්තියේ කාර්යය සඳහා"වෘත්තිකයකු" යන්නෙන්, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වෛද්‍යවරයකු, වරලත් ඉංජිනේරුවරයකු, මෘදුකාංග ඉංජිනේරුවරයකු, වරලත් වාස්තු විද්‍යාඥයකු, වරලත් ගණකාධිකාරීවරයකු සහ නීතිඥයකු අදහස් වන අතර, ඊට (365 වන අධිකාරය වූ) ගුවන් සංතරණ පනත යටතේ බලපත්‍රලත් ගුවන් නියමුවකු, නාවුක නිලධරයකු, සහ පිළිගත් වෘත්තිකයකු වශයෙන් සලකනු ලබන පර්යේෂකයකු හෝ ජ්‍යෙෂ්ඨ විද්වතකු ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ "2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ "2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ "2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56ඇ වගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් උපයනු ලබන ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් උපයනු ලබන, 13 වන වගන්තිය යටතේ බද්දෙන් නිදහස් කර ඇති ලාභ සහ ආදායම් කොටසක් නොවන, ලාභ සහ ආදායම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"යම් අපනයනකරුවකුට යම් සේවා සැපයීමෙන් ලැබෙන ලාභ සහ ආදායම මත වන බදු අනුප්‍රමාණය.

58. සෘජුවම හෝ යම් අපනයන වෙළෙඳ මධ්‍යස්ථානයක් හරහා භාණ්ඩ හා සේවා අපනයනය කරනු ලබන යම් අපනයනකරුවකු වෙත හෝ, සෘජුවම ඒ අපනයනකරුගේ යම් විදේශීය ප්‍රධානියකු වෙත, ඒ භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම සමග අත්‍යවශ්‍යයෙන් ම සම්බන්ධ වන බවට සලකනු ලැබිය හැකි යම් සේවාවන් සපයන ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකුට එකී සේවාවන් සඳහා ඒ අපනයනකරු විසින් හෝ විදේශීය ප්‍රධානියා විසින් විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් කරන්නේ නම් ද සහ-

(අ) ඒ සැපයීමට අදාළ අපනයනවල විදේශ විනිමය වටිනාකම ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම සඳහා ජාත්‍යන්තර ණයවර ලිපියකට එරෙහිව ගෙවීමෙන් පසු ගෙවීමේ පදනම මත, ශ්‍රී ලංකාවේ බැංකුවක විවෘත කරන ලද ජාත්‍යන්තර ණයවර ලිපියක් හෝ ණයවර ලිපියක් මගින් ඒ සැපයුම ආවරණය කර ඇත්නම්; හෝ

(ආ) (i) ඒ සැපයුම සඳහා වන ප්‍රතිෂ්ඨාව ඒ අපනයනකරු හෝ විදේශීය ප්‍රධානියා විසින්, ඒ තැනැත්තාගේ නමට ලියන ලද අණකරයක් හෝ විදුලි පණිවුඩ පැවරුමක් මගින් වූ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන්නේ නම්; හා

(ii) ඒ සැපයුම්වලට අදාළ භාණ්ඩ හා සේවා සත්‍ය වශයෙන් ම අපනයනය කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, ඔහු විසින් නියම කරන ලද වෙනත් යම් ලේඛනගත සාක්ෂියක් ඉදිරිපත් කර ඇත්නම් ද,

3 වන උපවගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වන ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායමෙන් ඒ සැපයීම්වලින් ලැබෙන ලාභ සහ ආදායම් කොටස මත, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නියමිත අනුප්‍රමාණය මත ආදායම් බදු අයකර ගනු ලැබිය යුතු ය.".

**24.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තියේ (1) වන උපවගන්තියේ "වෙනත් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද," යන වචන වෙනුවට "වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, එහෙත් 59ඊ වගන්තියේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඈ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඈ වගන්තිය සංශෝධනය කිරීම.

"සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සමාගමක් 2017 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පෙරාතුව ඉහත සඳහන් කළ ආකාරයට තම කොටස් ලැයිස්තුගත කරන අවස්ථාවක සහ ඒ සමාගම මේ පනතේ දෙවන උපලේඛනයේ ආ - කොටසේ 3 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත ආදායම් බදු ගෙවීමට යටත් වන අවස්ථාවක, ඒ අනුප්‍රමාණය ඒ සමාගම ලැයිස්තුගත කිරීමෙන් පසුව ඒ සමාගමේ කොටස්වලින් සියයට විස්සකට නොඅඩු කොටස් ප්‍රමාණයක්

පොදු මහජනතාව විසින් අඛණ්ඩව දරා සිටීමට යටත්ව, එම කොටස් ලැයිස්තුගත කරන ලද තක්සේරු වර්ෂය සඳහා සහ එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තවත් තක්සේරු වර්ෂ දෙකක කාලයක් සඳහා සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 59ඊ, 59උ සහ 59ඌ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඉ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ඒ ප්‍රඥප්තියේ 59ඊ, 59උ සහ 59ඌ වගන්ති ලෙස බලපැවැත්විය යුතු යඃ-

“වෘත්තීමය සේවා සැපයීමෙන් ලැබෙන ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය.

59ඊ. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් තැනැත්තකුගේ 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන බදු අය කළ හැකි ආදායමට වෘත්තිකයකු වශයෙන් වෘත්තීමය සේවා සැපයීමෙන් උපයනු ලබන යම් ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක දී, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ බදු අය කළ හැකි ආදායම් කොටස සඳහා මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා “වෘත්තිකයකු” යන්නට 40ඇ වගන්තියේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුත්තේ ය.

ඉදිකිරීමේ කාර්ය සඳහා වෘත්තිකයන් වෙත දෙනු ලබන ණය මත යම් බැංකුවක් විසින් උපයනු ලබන ලාභ සහ ආදායම සඳහා අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය.

59උ. (1) තනිවම හෝ වෙනත් යම් පුද්ගලයකු සමග එක්ව, නිවසක් ඉදිකිරීමේ හෝ නිවසක් මිලදී ගැනීමේ හෝ පදිංචිය පිණිස වන මහල් නිවාස සංකීර්ණයක නිවාස ඒකකයක් මිලදී ගැනීමේ කාර්යය සඳහා, වෘත්තිකයකු වන්නා වූ යම් පුද්ගලයකු වෙත දෙන ලද ණය මුදලක් මත යම් බැංකුවක් විසින් 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උපයන ලද ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය, සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා “වෘත්තිකයකු” යන්නට 40ඇ වගන්තියේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුත්තේ ය.

නැව් මෙහෙයවන්නන්, නැව් තනන්නන් හා විදේශීය නැවක යම් නියෝජිතයකු විසින් ගෙවිය යුතු වන ආදායම් බද්ද.

59උෟ. නැව් මෙහෙයවන්නකු, නැව් තනන්නකු හෝ විදේශීය නැවක යම් නියෝජිතයකු විසින් නාවුක කර්මාන්තයේ අභ්‍යාසලාභීන්හට නිපුණතා සංවර්ධනය සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දෙන්නේ නම්, ඒ නැව් මෙහෙයවන්නා, නැව් තනන්නා හෝ නියෝජිතයා විසින් ගෙවිය යුතු වන, මේ පනතට අනුව ගණනය කරනු ලබන බදු කොටස සියයට දහයකින් අඩු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** 2007 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ලාභාංශය" යන වචන වෙනුවට "යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ලාභාංශයෙන් උපයනු ලබන ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් පොළියක, වාර්ෂික බිම් කුලියක හෝ රාජ්‍ය භාගයක ප්‍රමාණය" යන වචන වෙනුවට "යම් පොළියක හෝ වාර්ෂිකයක ප්‍රමාණය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(3) 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, අනුක්‍රම තක්සේරු වර්ෂ දෙකක් හෝ වැඩි ගණනක් සඳහා වාසිකයකු ලෙස සලකනු ලැබූ පුද්ගලයකු දින තුන්සිය හැට පහක අඛණ්ඩ කාලසීමාවක් සඳහා ඔහු ශ්‍රී ලංකාවෙන් නොකඩවා බැහැරව සිටිනතාක් කල් වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා එසේ බැහැරව සිටින විට (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ බැහැරව සිටීම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට, නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "පහත දැක්වෙන අඩු කිරීම් සිදු කිරීමෙන් පසු නිශ්චය කරනු ලැබිය හැකි යः-" යන වචන වෙනුවට "පහත දැක්වෙන අඩු කිරීම් සිදු කිරීමෙන් පසු නිශ්චය කරනු ලැබිය හැකි අතර, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද එම ලාභ සහ ආදායමෙන් මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිසි අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකරනු ලැබිය යුතු යः-" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියේ (19) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේः-

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(20) මේ වගන්තියේ කාර්ය සඳහා කෙමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, යම් තැනැත්තකු හා වෙනත් තැනැත්තකු හෝ, යම් තැනැත්තකු හා තැනැත්තන් කාණ්ඩයක් අතර සිදු වූ යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යම් තොරතුරු ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව ඇතුළත සපයන ලෙස නියම කරමින් ඒ තැනැත්තාට දැනුම් දීම කළ හැකි ය.".

**32.** 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේः-

ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ ""අනුමත ගණකාධිකාරීවරයා" යන්නෙන් -" යන වචන වෙනුවට "අනුමත ගණකාධිකාරීවරයා" යන්නෙන්, 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ः-

"(අඅ) ''අනුමත ගණකාධිකාරීවරයා" යන්නෙන්, 2014 අප්‍රේල් මස 1 වන දින හෝ ඒදිනට පසුව ආරම්භ

වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරීවරයෙක් අදහස් වේ;"; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "නිශ්චය කරනු ලැබූ ශුද්ධ ලාභය අදහස් වේ;" යන වචන වෙනුවට "නිශ්චය කරනු ලැබූ ශුද්ධ ලාභය අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව ගණනය කරන ලද මෙහෙයුම් ලාභ ද ඇතුළත් වේ;" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයකුට යම් පාරිශ්‍රමිකයක් හෝ යම් ප්‍රතිලාභයක් ලබාදෙන හෝ සේවා නියුක්තයකු නොවන බවට සලකනු ලබන වෙනත් යම් තැනැත්තකුට මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රතිලාභයක් ලබාදෙන අවස්ථාවක" යන වචන වෙනුවට "අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට යම් පාරිශ්‍රමිකයක් හෝ යම් ප්‍රතිලාභයක් ලබා දෙන අවස්ථාවක හා ඒ අධ්‍යක්ෂවරයා, සභාපතිවරයා හෝ වෙනත් තැනැත්තා සේවා නියුක්තයකු නොවන බවට සලකනු ලබන අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මෙම පරිච්ඡේදයේ විධිවිධාන අනුව" යන වචනවල සිට ඒ උපවගන්තිය අවසානය දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"මේ පරිච්ඡේදයේ විධිවිධාන අනුව එකී පාරිශ්‍රමික සහ ප්‍රතිලාභවල වටිනාකමින්, එහි එකතුව-

(අ) (i) මසකට රුපියල් විසි පන්දහසක් නොඉක්මවයි නම්; හෝ

(ii) මසකට රුපියල් පනස්දහසක් නොඉක්මවයි නම් හා ඒ සේවා නියුක්තයා රාජ්‍ය අංශයේ සේවා නියුක්ත පුද්ගලයකු නම්,

සියයට දහයක අනුප්‍රමාණයකට; හෝ

(ආ) (i) මසකට රුපියල් විසි පන්දහසක් ඉක්මවයි නම්; හෝ

(ii) මසකට රුපියල් පනස්දහසක් ඉක්මවයි නම් හා ඒ සේවා නියුක්තයා රාජ්‍ය අංශයේ සේවා නියුක්ත පුද්ගලයකු නම්,

සියයට දහසයක අනුප්‍රමාණයකට,

ආදායම් බදු අඩු කළ යුතු ය. එකී ගෙවීම් හෝ ප්‍රතිලාභවල අගය සම්බන්ධයෙන්, 118 වන වගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීම හෝ භාරගැනීම නොකළ යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) යම් පුද්ගලයකු එක් සේවා යෝජකයකුට වැඩි සේවා යෝජකයන් සංඛ්‍යාවක් යටතේ සේවා නියුක්තව සිටිමින් හෝ එක් සේවා නියුක්තියකට වැඩි සේවා නියුක්ති සංඛ්‍යාවක නිරතව සිටිමින්, යම් මෝටර් වාහනයක් පෞද්ගලිකව පරිහරණය කිරීමෙන් යම් ප්‍රතිලාභයක් හෝ ඒ වාහනය සැපයීම වෙනුවට ගෙවනු ලබන යම් දීමනාවක් හෝ යම් ප්‍රවාහන පහසුකමක් වෙනුවෙන් වන යම් වටිනාකමක් එක් සේවා යෝජකයකුට වැඩි සංඛ්‍යාවකගෙන් හෝ එක් සේවා නියුක්තියකට වැඩි සංඛ්‍යාවකින් ලබන අවස්ථාවක දී, ඒ ප්‍රතිලාභයේ හෝ ඒ දීමනාවේ හෝ ඒ වටිනාකමේ එකතුවේ රුපියල් පනස් දහස ඉක්මවන ආදායම් කොටස, ඒ සේවා නියුක්තයාගේ බදු අයකිරීමට යටත් සේවා නියුක්ති ආදායමේ කොටසක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** 2007 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද අඩුකිරීම, මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද යම් පොළියකට අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "9 වන වගන්තියේ (ච) ඡේදයේ සඳහන් යම් පොළියෙන් හෝ වට්ටමෙන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "9 වන වගන්තියේ (අඅ) ඡේදයේ හෝ (ච) ඡේදයේ සඳහන් යම් පොළියෙන් හෝ වට්ටමෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** 2007 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(3) සැකදුරු කිරීම සඳහා, යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ සඳහන් පොළී ආදායම යන්නෙන්, යම් සුරැකුමකින්, බැඳුම්කරයකින් හෝ බිල්පතකින් උපයනු ලබන හෝ උපචිත වන ලාභ සහ ආදායම අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

**38.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ (5) වන උපවගන්තියේ අතුරු විධානයේ "එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදාළ යම් හිඟ මුදල් ඒ තැනැත්තා විසින් ලබාගැනීමට ආනුෂංගිකව" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුව ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(i) යම් තැනැත්තකු විසින් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදාළ යම් හිඟ මුදල් ඒ තැනැත්තා විසින් ලබාගැනීමට; හෝ

(ii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාළ කර ගැනීමට සමගාමීව, ඒ අදාළ කරගැනීම සිදු වූ තක්සේරු වර්ෂය සඳහා කරන ලද යම් ගැළපීමකට,

ආනුෂංගිකව,”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය සංශෝධනය කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තියේ (2) වන උපවගන්තියේ “එක් සම්පූර්ණ තක්සේරු වර්ෂයක් සඳහා නියම කරන ලද” යන වචන වෙනුවට “සම්පූර්ණ තක්සේරු වර්ෂ පහක් සඳහා නියම කරන ලද” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(3) (1) වන උපවගන්තියේ සහ (2) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, මේ පනතේ විධිවිධානවලට අනුකූල යයි සලකනු ලබන දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක්, එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් සහ තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ තක්සේරුව බලපාන හෝ තැනැත්තා, පොදු අධ්‍යාශයට හා වැටහීමට අනුව ඒ දැන්වීමෙහි, තක්සේරුවෙහි, සහතිකයෙහි හෝ වෙනත් කටයුත්තෙහි නම් කර තිබේ නම්, ගැසට් පත්‍රයේ පළ කරන ලද පරිදි ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම හේතුවෙන්, අවස්ථාවෝචිත පරිදි, එම දැන්වීම, තක්සේරුව, සහතිකය හෝ වෙනත් කටයුත්ත අත්සන් කරනු ලැබූ හෝ සහතික කරනු ලැබූ නිලධරයාගේ තනතුරු නාමයෙහි යම් වෙනසක් තිබීම හේතුවෙන් එම දැන්වීම, තක්සේරුව, සහතිකය හෝ වෙනත් කටයුත්ත නිෂ්ප්‍රභ කරනු නොලැබිය යුතු ය. නැතහොත් ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය සංශෝධනය කිරීම.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ තැනැත්තාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට" යන වචන වෙනුවට "ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ඉ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම රාජකාරී කටයුතු ඉටු කරන අතරවාරයෙහි, ලිඛිතව වූ ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයට භාජනය කරනු ලබන යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළව හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ, පුත්‍රයකුගේ හෝ දුවකගේ හෝ කටයුතුවලට අදාළව තමාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති සියලු තොරතුරු, ඒ ලියවිල්ලෙහි සඳහන් කර ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු ය;

(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම රාජකාරී කටයුතු ඉටු කරන අතරවාරයෙහි, ලිඛිතව වූ ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තොරතුරු රැස්කරනු ලබන හෝ සංඛ්‍යාලේඛනරැස් කරනු ලබන යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළව හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ, පුත්‍රයකුගේ හෝ දුවකගේ හෝ කටයුතුවලට අදාළව තමාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති සියලු තොරතුරු, ඒ ලියවිල්ලෙහි සඳහන් කර ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු ය;

(උ) මහජන යහපත සඳහා බලපාන යම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ අපරාධ මගින් ලද ඉපැයීම්

සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරන අතරවාරයෙහි හෝ, අල්ලස් ගැනීම හෝ දූෂණ සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් ආරම්භ වීමෙන් පසු, නිසි බලය ඇති අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවකට අනුකූලව පොලිස්පතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ කටයුතුවලට අදාළව තමා වෙත ඇති සියලු තොරතුරු, ඒ ආඥාවේ සඳහන් පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ඒ තැනැත්තාගේ හෝ කලත්‍රයාගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ හෝ කටයුතුවලට අදාළ, යම් ලේඛනයක සහතික කරන ලද පිටපතක්, ඒ ආඥාවේ සඳහන් පරිදි සැපයිය යුතු ය.''; සහ

(3) ඒ වගන්තියේ 12 වන උපවගන්තියේ "අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට" යන වචන වෙනුවට "අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට" යන වචන ආදේශ කිරීමෙන්.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයේ "පන්සියයකට වැඩි නොවිය යුතු වූ ද, දණ්ඩන." යන වචන වෙනුවට "පන්සියයකට වැඩි නොවිය යුතු වූ ද, දණ්ඩන;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඉ) ශ්‍රී ලංකාව තුළ අදාළ වන මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් වෙනස් කරනු ලබන කවර හෝ අවස්ථාවක, ලාභ සහ ආදායම ගණනය කරන ආකාරය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) "බලයලත් නියෝජිතයා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි, (1) වන ඡේදයේ (අ) අනුඡේදයේ (ii) වන අයිතමය ඉවත් කිරීමෙන්; සහ

(2) "විධායක නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "රුපියල් විසිදහසකට අඩු නොවන" යන වචන වෙනුවට "රුපියල් හැත්තෑ පන්දහසකට අඩු නොවන" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

**44.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ ආ කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ කොටසේ 1 වන අයිතමයේ -

(අ) ඒ අයිතමයේ (ඇ) ඡේදයේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචනවල සිට ඒ අයිතමයේ අවසානය දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින සමාගමක් නොවන -

(අ) (i) බදු අය කළ හැකි ආදායම රුපියල් 5,000,000/- ක් නොඉක්මවන;

(ii) "අ" කොටසේ සඳහන් කරන ලද සමාගමක් නොවන; සහ

(ආ) පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් නොවන,

| | |
|---|---|
| යම් සමාගමක බදු අය කළ හැකි අදායම මත | සියයට 12;"; |

(ආ) ඒ අයිතමයේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින සමාගමක් වන -

(අ) (i) බදු අය කළ හැකි ආදායම රුපියල් 5,000,000 ක් නොඉක්මවන;

(ii) "අ" කොටසේ සඳහන් කරන ලද සමාගමක් නොවන; සහ

(ආ) පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් නොවන,

යම් සමාගමක බදු අය කළ හැකි අදායම මත සියයට 12

(ආ) ඡේදයේ (ආ) අයිතමයේ, (ඇ) ඡේදයේ සහ (ඈ) ඡේදයේ කාර්ය සඳහා "පාලක සමාගම", "පාලිත සමාගම" සහ "සමූහ සමාගම්" යන යෙදුම්වලට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඒවාට දී ඇති එම අදාළ අර්ථයන් ම තිබිය යුතු ය.";

(2) ඒ කොටසේ 2 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"2. යම් සමාගමක්, 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන්නා වූ ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර දී ඇති ව්‍යාපාර වස්තු හුවමාරුවක් විසින් ප්‍රසිද්ධ කරන ලද යම් නිල ලැයිස්තුවක තම කොටස් පළමුව ලැයිස්තුගත කරනු ලැබුවා වූ ද (මෙහි මින්මතු "පළමුවන තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) තක්සේරු වර්ෂය සඳහා සහ ඒ

පළමුවන තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු හතර ඇතුළත එක් එක් තක්සේරු වර්ෂය සඳහා -

(අ) බදු අයකළ හැකි ආදායම රුපියල් 5,000,000 ක් ඉක්මවන; හෝ

(ආ) පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් වන,

සමාගමක් නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත -

| | |
|---|---|
| (i) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 33 1/3 |
| (ii) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 28 |

එසේ වුව ද, ඒ පළමුවන තක්සේරු වර්ෂය 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, සියයට 33 1/3 ක අනුප්‍රමාණය අදාළ වනුයේ එම අවුරුදු හතරක කාලය ඇතුළත් වන්නා වූ ද, 2006 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන්නා වූ ද, යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙනි.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**45.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 22 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"22. 58 වන වගන්තියේ සඳහන් ලාභ සහ ආදායම මත ආදායම් බදු අනුප්‍රමාණය -

| | |
|---|---|
| (අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 15 |
| (ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | සියයට 12 |
| (ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12"; |

(2) ඒ උපලේඛනයේ 33 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"33. 59ආ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය -

| | |
|---|---|
| (අ) 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 10 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10 |

| | |
|---|---|
| (ආ) 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12"; |

(3) ඒ උපලේඛනයේ 42 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

| | |
|---|---|
| "42. 56අ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම් කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය - | සියයට 12"; |

(4) ඒ උපලේඛනයේ 45 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"46. 59ඊ වගන්තියේ සඳහන් යම් වෘත්තියකින් යම් පුද්ගලයකුට ලැබෙන ලාභ සහ ආදායම් කොටසට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය -

| | |
|---|---|
| (අ) ඒ බදු අයකළ හැකි ආදායම රුපියල් 25,000,000 ක් නොඉක්මවන අවස්ථාවක | පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 ක උපරිමයකට යටත්ව |
| (ආ) ඒ බදු අයකළ හැකි ආදායම රුපියල් 25,000,000 ක් ඉක්මවන, එහෙත් රුපියල් 35,000,000 ක් නොඉක්මවන අවස්ථාවක | සියයට 14 |

| | |
|---|---|
| (ඇ) ඒ බදු අයකළ හැකි ආදායම රුපියල් 35,000,000 ක් ඉක්මවන අවස්ථාවක | සියයට 16.”. |

46. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.